# නාට්‍ය හා රංගකලාව
# 09 ශ්‍රේණිය

02 වන වාරය

නිපුණතාව 2.0 : ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොට ගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

නිපුණතා මට්ටම 2.4 : තමා තෝරාගත් තේමාවක් අනුව නිර්මාණාත්මකව කුසලතා ප්‍රදර්ශනය කරයි.

## තේමාවක් තෝරාගෙන නාට්‍ය පෙළක් රචනා කරමු

### තේමාව

- තේමාව ලෙස අදහස් කරන්නේ නාට්‍යයක හෝ වෙනත් කිසියම් කලා මාධ්‍යයක් මඟින් ලබාදෙන පණිවුඩයයි. මෙය නාට්‍යයක යටි පෙළ අදහස යනුවෙන් ද හඳුන්වනු ලබයි. නාට්‍ය තේමාව මඟින් නාට්‍යය ද සාර්ථක වේ. එමඟින් ප්‍රේක්ෂකයා මනා රසවින්දනයක් ලබා ගනී. ඕනෑම කලා මාධ්‍යක් නිර්මාණය වී ඇත්තේ තේමාවක් පෙර දැරි කරගෙන ය. නාට්‍ය ජන කතා, ජාතක කතා, චිත්‍රපට, ටෙලි නාට්‍ය, නව කතා, විෂයානු බද්ධ පාඩම් යන මේ සියල්ලෙහි ම තේමාවක් ඇත.

# හාවයි නරියයි ලබු කිරිබත් ඉව්ව හැටි - ජන කතාව



https://youtu.be/Tz8tZJretTA ← අපි කතාව බලලම ඉමු නේද..?

# ආඬි හත්දෙනාගේ කැඳ හැලිය - ජාතක කතාව



https://youtu.be/2uAKCPRQcLk ← මේකත් බලමු නේද ?

# සූරිය අරණ - චිත්‍රපටය





https://youtube.com/playlist?list=PLm6RCG2b5Bx3I1B-vAcE9g55Pp4hh3PFG

# ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් - දුරකථනය නිපදවීම



- ඇලෙක්ස්සැන්ඩර් ග්‍රැහැම්බෙල් ගැන තව විස්තර මෙතනින් බලාගන්න පුලුවන් - https://en.m.wikipedia.org/wiki/Alexander_Graham_Bell

# නිව්ටන්ගේ ගුරුත්වාකර්ෂණ නියමය සම්බන්ධ කතාව



https://en.m.wikipedia.org/wiki/Isaac_Newton

ඉහත විවිධ තේමා රැගත් කතාවන් නොයෙකුත් පණිවුඩ මිනිසාට ලබා දේ. එම තේමාවන් පහත හඳුනා ගනිමු.

- උත්සාහවන්තයා ජයගනී.
- සිත ඇත්නම් පත කුඩා ද?
- සිටියෙත් හොඳට හැදී දෙවියොත් නමට වඳී.
- දුප්පත්කම දියුණුවට බාධාවක් නොවේ.
- අභියෝග හමුවේ නොසැලී සිටීමෙන් ජීවිතය ජය ගත හැකි ය.
- මව්පිය සෙනෙහස අසීමිත ය.

# නාට්‍ය පෙළ රචනයේ දී අවධානය යොමු කළ යුතු කරුණු

- කතාවේ ඇති අපූර්ව බව හෙවත් නොඇසූවිරූ, නොදුටු විරූ බව
- සිදුවීම මුල, මැද, අග වශයෙන් මනාව ගැලපීමේ හැකියාව
- කිසියම් අරමුණක් පෙරදැරි කරගෙන කතාව විකාශනය කළ හැකි වීම
- කුතුහලයෙන් යුකුත වීම
- ගැටුම් සහිත වීම
- විශ්වාසනීය ව ඉදිරිපත් කිරීමට හැකි වීම
- ප්‍රේක්ෂකයාට රසයක් ලබා ගත හැකි විය යුතු මෙන් ම බුද්ධි ගෝචර වීම
- වේදිකාව මත ප්‍රති නිර්මාණය කළ හැකි සිදුවීම්, ක්‍රියා හා ස්ථාන සහිත වීම

- කතාවක් තෝරාගෙන නාට්‍ය රචකයා තමාගේ පරිකල්පන ශක්තිය, නිර්මාණශීලී චින්තනය යොදා ගනිමින් නාට්‍ය පිටපත ලිවිය යුතු ය. නාට්‍යයේ තේමාව උද්දීපනය වන පරිදි සංවාද ගොඩ නැගිය යුතු ය.

- නිවිතිගල කලාපීය නාට්‍ය හා රංගකලා ගුරු එකමුතුවේ සැකසුමකි.